# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2424/59 - 2025 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2025.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තිය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක ජී. එල්. 24 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2024 දෙසැම්බර් මස 16 දින අංක 2415/20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "මනෝ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාවන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී,

1. අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 06 වන ස්ථරයේ) ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්;

   1.1. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී එක් අවස්ථාවකදී පහත (අ) කාණ්ඩයේ විෂයක් හා (ආ) කාණ්ඩයේ විෂයයන් දෙකක් (02) ක් සාමාන්‍ය (එස්) සාමාර්ථයක් සහිතව සමත් වීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම

   (අ) i සංයුක්ත ගණිතය
   ii උසස් ගණිතය

(ආ) i. ගිණුම්කරණය
ii. ආර්ථික විද්‍යාව
iii. ව්‍යාපාර සංඛ්‍යානය
iv. ව්‍යාපාර අධ්‍යයනය
v. භෞතික විද්‍යාව
vi. රසායන විද්‍යාව
vii. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
සහ

1.2. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා අවම වශයෙන් සම්මාන (සී) සාමාර්ථයක් සහ විද්‍යා විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය (එස්) සාමාර්ථයක් ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

2. අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 06 වන ස්ථරයේ) ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ජීව විද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය (එස්) සාමාර්ථ තුනක් (03) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

3. අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 10 වන ස්ථරයේ) බුද්ධිමය යාන්ත්‍රි විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සම්බන්ධයෙන්;

3.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව, පරිගණක ඉන්ජිනේරු හෝ දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; හෝ

3.2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි පිරිනැමීමේ ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයක උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ අවුරුද්දක පළපුරුද්දක් සහිත වීම

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

4. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතුය.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව (ප්‍රමාණ සමීක්ෂණය) |
| ජෛව වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව (ජෛව වෛද්‍ය විද්‍යාව) |
| බුද්ධිමය යාන්ත්‍රි විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | එම්එස්සී (බුද්ධිමය යාන්ත්‍රි විද්‍යාව) |

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

EOG 02 - 0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.